“ජාතක පොත” සහ “මානසික රෝග පිළිබඳ රෝග විනිශ්චය හා සංඛ්‍යාත්මක දත්ත අත්පොත” තුළින් පැනෙන අසාමාන්‍ය චර්යා පිළිබඳ සංසන්දනාත්මක අධ්‍යයනයක්

A Comparative Study of Abnormal Behaviours reflected in the Jataka Book and the Diagnostic and Statistical Manual of Mental Disorders (DSM-5)

වාසනා ප්‍රනාන්දු

Abstract

This qualitative comparative study was conducted as part of the requirements for a master's degree in Buddhist Āyurvedic Counselling, titled “A Comparative Study of Abnormal Behaviours in the Jataka Book and the Diagnostic and Statistical Manual of Mental Disorders (DSM-5)”. The primary objectives included identifying abnormal behaviours reflected in the Jataka stories and examining the similarities and differences between these narratives and the DSM-5. The study drew on Buddhist commentary literature as the primary source, supplemented by secondary and tertiary sources. The findings revealed various abnormal behaviours in the Jataka stories that could be correlated with DSM-5 categories. Many narratives in the Jataka Book depicted issues related to sexual function and satisfaction, aligning with “Psycho-Sexual Dysfunction and Paraphilic Disorders” in the DSM-5. Similarly, stories portraying anger and aggressive behaviours were linked to “Personality Disorders” in the DSM-5. Moreover, certain Jataka stories reflected conditions such as “Schizophrenia, Mental Retardation, Developmental Disorders, Dissociative Identity

Disorders, Possession Disorders, Psychological Disturbances, Mood Disorders, Depression, Anxiety Disorders, Somatoform Disorders, Trauma and Stress-Related Disorders, and Substance Disorders (Alcohol Dependency, Psychoactive Drug Use)", all of which are recognized in the DSM-5. In summary, the DSM-5-based mental disorders align with the eight types of "unmade" psychiatric disorders mentioned in the 'Darīmukha Jataka Story,' including Kama Unmada, Krodha Unmadha, Darshana Unmada, Moha Unmadha, Yaksha Unmada, Pittha Unmada, and Viyasana Unmada. This research concludes that the Jataka Story Book, as the oldest classification of mental disorders, remarkably illustrates many modern mental disorders documented in the DSM-5.

Keywords: Abnormal Behaviours, Buddhist Psychopathology, DSM-5, Mental Disorders, Jataka Story Book.

සාරසංක්ෂේපය

"ජාතක පොත" සහ "මානසික රෝග පිළිබඳ රෝග විනිශ්චය සහ සංඛ්‍යානමය දත්ත අත්පොත" තුළින් පැනෙන අසාමාන්‍ය චර්යාවන් පිළිබඳව සංසන්දනාත්මක අධ්‍යයනයක් යන මැයෙන් බෞද්ධ ආයුර්වේද උපදේශනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියෙහි ශාස්ත්‍රීය අවශ්‍යතාවය මත ගුණාත්මක හා සංසන්දනාත්මක පර්යේෂණ ක්‍රමවේද ඔස්සේ මෙම පර්යේෂණය සිදු කරන ලදී. ජාතක කතාවලින් පිළිබිඹු වන අසාමාන්‍ය හැසිරීම් හඳුනා ගැනීම සහ එම ආඛ්‍යාන මගින් නිරූපණය කරන අසාමාන්‍ය චර්යාවන් සහ මානසික අක්‍රමතා පිළිබඳ රෝග විනිශ්චය සහ සංඛ්‍යානමය දත්ත අත්පොතෙහි සඳහන් මානසික අක්‍රමතා අතර සමවිෂමතා පරීක්ෂා කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණු විය. අධ්‍යයනය සඳහා අවශ්‍ය මූලාශ්‍රය වශයෙන් බුදුදහමේ විවරණ සාහිත්‍යයට අයත් සිංහල අට්ඨකතාවල පන්සිය පනස් ජාතක පොත සහ මානසික රෝග පිළිබඳ රෝග විනිශ්චය සහ සංඛ්‍යානමය දත්ත අත්පොත ද ද්වීතීක මූලාශ්‍ර ලෙස සැලකෙන තවත් බෞද්ධ හා මනෝවිද්‍යාත්මක

පොතපත ද තෘතීක මූලාශය යටතේ වෙනත් පර්යේෂණ ලිපි සහ පොතපත ද යොදාගන්නා ලදි. වර්තමාන පර්යේෂණයේ සොයාගැනීම් මගින් ජාතක පොතෙහි සඳහන් ආඛ්‍යාන සහ මානසික රෝග පිළිබඳ රෝග විනිශ්චය සහ සංඛ්‍යානමය දත්ත අත්පොතෙහි සඳහන් රෝග කාණ්ඩ සමඟ සහසම්බන්ධ කළ හැකි විවිධ අසාමාන්‍ය හැසිරීම් අනාවරණය විය. ඒ අනුව ජාතක පොතෙහි එන බොහෝ ආඛ්‍යාන ලිංගික ක්‍රියාකාරීත්වය සහ තෘප්තිය සම්බන්ධ ගැටලු නිරූපණය කර ඇති අතර ඒවා මානසික රෝග පිළිබඳ රෝග විනිශ්චය සහ සංඛ්‍යානමය දත්ත අත්පොතෙහි සඳහන් "මනෝ ලිංගික අක්‍රමතා සහ පැරෆිලියා අක්‍රමතා" සමඟ සමපාත වේ. ඒ හා සමානව, කෝපය සහ ආක්‍රමණශීලී හැසිරීම් නිරූපණය කරන කතා මානසික රෝග පිළිබඳ රෝග විනිශ්චය සහ සංඛ්‍යානමය දත්ත අත්පොතෙහි "මනෝභාව සහ පෞරුෂ අක්‍රමතා" ලෙස හඳුනාගත හැකි විය. එපමණක් නොව, ඇතැම් ජාතක කතාවල "භින්නෝන්මාදය, මානසික බුද්ධිහීනතාවය, සංවර්ධන අක්‍රමතා, විඝටන අනන්‍යතා ආබාධ, ආවේශාත්මක අක්‍රමතා, මනෝභාව අක්‍රමතා, විශාදය, කාංසා අක්‍රමතා සහ කායරූපී අක්‍රමතා, ව්‍යසන සහ ආතතිය හා සම්බන්ධ අක්‍රමතා, මත්ද්‍රව්‍ය ධූර්තතාවය සහ මනෝ ක්‍රියාකාරී මත්ද්‍රව්‍ය වැනි මත්පැන් හා මත්ද්‍රව්‍ය හා සම්බන්ධ අක්‍රමතා වැනි අසාමාන්‍ය චර්යාවන් රැසක් නිරූපණය කොට ඇත. සාරාංශයක් ලෙස, "දරීමුඛ ජාතකයේ" දැනට විධිමත් ලෙස මානසික අක්‍රමතා ලෙස සඳහන් නොකළ අටවැදෑරුම් රෝග ලෙස සැලකෙන කාම උන්මාද, ක්‍රෝධ උන්මාද, දර්ශන උන්මාද, මෝහ උන්මාද, යක්ෂ උන්මාද, පිත්ත උන්මාදය සහ ව්‍යසන උන්මාදය යනාදි තත්ත්වයන් මානසික පිළිබඳ රෝග විනිශ්චය සහ සංඛ්‍යානමය දත්ත අත්පොතෙහි අන්තර්ගත අසාමාන්‍ය චර්යාවන් සමග ඇතැම් ලක්ෂණ මත පදනම්ව සමවිෂම පෙන්නුම් කෙරේ. මේ අනුව මානසික රෝග පිළිබඳ රෝග විනිශ්චය සහ සංඛ්‍යානමය දත්ත අත්පොතෙහි ලේඛනගත කර ඇති බොහෝ නවීන මානසික අක්‍රමතාවයන් ජාතක කතා පොත තුළින් කැපී පෙනෙන ලෙස නිරූපණය කර ඇති බවට සමාලෝචනය කළ හැකි වේ.

මුඛ්‍ය පද: ජාතක කතා පොත, මානසික පිළිබඳ රෝග විනිශ්චය සහ සංඛ්‍යානමය දත්ත අත්පොත, මානසික අක්‍රමතා, අසාමාන්‍ය චර්යා, බෞද්ධ මනෝව්‍යාධිවේදය

හැඳින්වීම

සිංහල සාහිත්‍ය වංශකතාවෙහි ප්‍රබෝධයට හේතු වූයේ බුදුදහමේ හරයන් ඔස්සේ සාහිත්‍ය කලාව පෝෂණයවීමයි. එහි ප්‍රතිඵලයක් ලෙස බුද්ධ වර්ෂ 14 වන ශතවර්ෂයේ සිට මේ දක්වා සිංහල සාහිත්‍ය ධර්ම ග්‍රන්ථ 26 ක් පමණ ශේෂව පවතී. ධම්පියා අටුවා ගැටපදය, අමාවතුර, ධර්ම ප්‍රදීපිකාව, බුත්සරණ, දම්සරණ, සඟසරණ, පූජාවලිය, සද්ධර්මරත්නාවලිය, විසුද්ධිමාර්ගය, මහාසන්නය, දළදා සිරිත, සද්ධර්මාලංකාරය ඉන් කිහිපයක් වන අතර සිවුවන පරාක්‍රමබාහු රජ සමයේ ග්‍රන්ථාරූඪ වූ පන්සිය පනස් ජාතකයට ද මෙම කෘතීහු අතර සුවිශේෂී බවක් හිමි වේ (රණතුංග, 2015). ජාතක කතා පොතෙහි එන කතාන්දර මඟින් මිනිස් ජීවිතවල පවත්නා දුබලතා පෙන්වීම මෙන් ම ඒවා ක්‍රමයෙන් උපහාසයට ලක් කොට දැක්වීමේ ස්වභාවයක් දක්නට ලැබේ. ඒ තුළින් එය ශ්‍රවණය කරන පුද්ගලයා සිය ජීවිතය හා චරිත ස්වාභාවය ඒ හා සසඳමින් සිය දුබලතා මඟහරවා ගනු ලැබීය. මෙය ශ්‍රැතිගෝචර ප්‍රතිකාරාත්මක ක්‍රමවේදයක් ලෙසින් ද හැඳින්විය හැකි වේ. මෙය නූතනයේ දී පුස්තක චිකිත්සා ක්‍රමවේදය ලෙසින් ද හඳුන්වනු ලබයි (හරිශ්චන්ද්‍ර , 2013, පි.49).

මීට අමතරව ජාතක කතා තුළ ඇති මනෝවිද්‍යාත්මක අගය ද සුවිශේෂී වේ. නූතන මිනිසා සංකීර්ණ හා කාමභෝගී ජීවන රටාවක් ගත කරමින් සිටින අතර මේ හේතුවෙන් විවිධ ගැටලු සඳහා මුහුණපෑමට සිදුවී ඇත. එවැනි පසුබිමක් තුළ ජීවත් වූ අතීත මිනිසාගේ සහ එවැනි පසුබිමක් තුළ තවමත් ජීවත්වන නූතන මිනිසාගේ සිත තුළ ඇතිවන විවිධ වූ මානසික සංකූලතා සහ ඒවාට විසඳුම් ගෙන දෙන ජාතක කතාවලට සුවිශේෂී ස්ථානයක් හිමි වේ. ඒ අනුව එහි සඳහන් බොහෝමයක් ජාතක කතාවන්හි එන චරිත සහ සිදුවීම් දෙස බලනවිට නූතන බටහිර "මානසික අක්‍රමතා පිළිබඳ රෝග විනිශ්චය හා සංඛ්‍යා දත්ත අත්පොතෙහි" (DSM : Diagnostics and Statistical Manual of Mental Disorders) සඳහන් වර්ගීකරණයන්ට අයත් බොහෝමයක් අසාමාන්‍ය චර්යාවන් ඒ තුළින් හඳුනාගත හැකි අතර එහි සමවිෂමතා කවරේදැයි විමසා බැලීම මෙම පර්යේෂණයේ මූලික ආධ්‍යාශය විය.

සාහිත්‍ය විමර්ශන

ජාතක කතා පොත සහ මානසික රෝග පිළිබඳ රෝග අත්පොත ජාති (Jati) යනු 'උපත' යන අර්ථය ගෙනදෙන සංස්කෘත වචනයකි. 'ජාතක' යනු උත්පත්ති කතා ලෙසත් ජාතකය (ජ්ජ්න්හ්) යනු එහි සිංහල වචනාර්ථය ලෙසත් හැඳින්විය හැකි වේ. මෙම අර්ථය පදනම් කොට ගෙන ඉන්දියාවේ සම්භවය ලත් ගෞතම බුදුරජාණන් වහන්සේගේ පූර්ව සත්ත්ව හා මනුෂ්‍ය භවයන් හා සම්බන්ධ කතා පුවත් පන්සිය පනහකින් සමන්විත කෘතියක් සම්පාදනය විය (වෝඩර්, 2000, පි. 332-333). එය පන්සිය පනස් ජාතක පොත්වහන්සේ වශයෙන් හඳුන්වනු ලබයි (හරිශ්චන්ද්‍ර, 2015). එහෙත් පුරාවිද්‍යාත්මක සහ සාහිත්‍යානුකූල විමසා බැලීම්වලට අනුව එහි අන්තර්ගතව පවතින්නේ කතා පුවත් හාරසිය හතළිස් හතක් පමණි. ඒ අනුව ජාතක කතා යනු ගෞතම බුදුරජාණන් වහන්සේගේ සාංසාරික ගමන්මගෙහි පැවති විවිධ ජීවන කතා පුවත්හි එකතුවකැයි සඳහන් කළ හැකි වේ. මෙහි සඳහන් කතා පුවත් සහ චරිතයන්ගෙන් බාල, මහළු, තරුණ යන ත්‍රෛකාලික අවධීන්ට අයත් සැමදෙනාට ම තම චර්යාව හා මානසික ස්වභාවය ස්වයං විශ්ලේෂණයකට ලක් කොට බැලීමටත් ඒ ඔස්සේ තම චර්යාව හා චින්තනය වඩා යහපත්ව පවත්වා ගැනීමටත් මෙම ජාතක කතා පොත උපයෝගීවනු ඇත (සුසීම හිමි සහ වෙනත් අය, 2004). ඒ අනුව පන්සිය පනස් ජාතක පොත්වහන්සේ යනු මනුෂ්‍ය ගුණධර්ම පෝෂණයට, පුරුෂාර්ථ සාධනයට, විෂම ගති නිශේධනයට, චරිත සංවර්ධනයට, පුද්ගලාවබෝධයට, චිත්ත සමාධියට සහ ලෞකික මෙන් ම ලෝකෝත්තර සුවයට හේතුවන පුද්ගලයාගේ චර්යාව හා චින්තනය සුබවාදී ලෙස වෙනස් කරවන කතාපුවත් සහිත පරමාදර්ශී කෘතියකැයි හැඳින්විය හැකි වේ (රණතුංග, 2015).

වර්තමානය වනවිට මානසික රෝග පිළිබඳව ඉදිරිපත්ව ඇති ප්‍රධාන ම වර්ගීකරණය ලෙස සැලකෙනුයේ දෙවන ලෝක යුද සමයෙන් පසුව ඇති වූ බලපෑම හේතුවෙන් පැවති මානසික අක්‍රමතා වර්ගීකරණය කිරීමේ අවශ්‍යතාව මත පදනම්ව ඇමරිකානු මනෝවෛද්‍ය සංගමය විසින් වර්ෂ 1952 දී Diagnostic and Statistical Manual of Mental Disorders හෙවත් මානසික රෝග පිළිබඳ රෝග විනිශ්චය සහ සංඛ්‍යාවිද්‍යාත්මක අත්පොත යන්න යි. අනතුරුව මෙය

වර්ෂ 2022 (DSM-5TR) දක්වා වරින්වර සංස්කරණයන්ට ලක්විය. මෙම මානසික රෝග පිළිබඳව ඉදිරිපත්ව ඇති අත්පොත තුළ ඒ ඒ රෝගයන්ට අදාළව පවත්නා සායනික ලක්ෂණ, රෝග තත්ත්වය පවතින කාල පරාසය යානාදි නොයෙක් තොරතුරු ඒ තුළ අන්තර්ගත වේ. මේ අනුව පුද්ගලයා තුළ ඇතිවිය හැකි අසාමාන්‍ය චර්යාවන් සහ ඒවාට අයත් ගතිලක්ෂණ සහ හේතු පිළිබඳව විස්තරාත්මක සඳහනක් බටහිර මනෝවිද්‍යාත්මක ලෝකය තුළින් ඉදිරිපත් කර ඇතැයි හඳුනාගත හැකි වේ.

අසාමාන්‍ය චර්යා පිළිබඳ බෞද්ධ විග්‍රහය

ත්‍රිපිටකයේ සූත්‍ර පිටකයෙහි එන අංගුත්තර නිකායට අයත් රෝග සූත්‍රයෙහි සඳහන් පරිදි පුද්ගලයා හට වැළඳෙන ප්‍රධාන රෝග වර්ග දෙකකි. එනම්, කායික රෝග සහ චෛතසික රෝග යනාදිය යි. සාමාන්‍යයෙන් පුද්ගලයෙකුට කායික රෝගයන්ගෙන් තොරව දින, සති, මාස මෙන් ම වසර ගණනාවක් වුව ද ජීවත්ව සිටිය හැකි අතර මානසික රෝගයකින් තොරව පුද්ගලයෙකුට ක්ෂණයක් වුව ද ජීවත්විය නොහැකිය. එසේ සිටින්නේ නම් ඔවුහු ඉතා දුර්ලභ හා සුවිශේෂී පුද්ගලයින් විය යුතු අතර ඒ රහතන්වහන්සේලා පමණි. මේ පිළිබඳව රෝග සූත්‍රයෙහි සඳහන් වන්නේ මෙසේ ය (සොයිසා, 2013).

මහණෙනි, රෝගයෝ දෙදෙනෙකි. කවර දෙදෙනෙක යත්ඃ කායිකරෝගය හා චෛතසික රෝග යි. මහණෙනි, කායික රෝග යෙන් එක් හවුරුද්දකුදු පිළිණ කරණ, දෙකකුදු පිළිණ කරණ, ... සත්හු පැණෙති. මහණෙනි, මේ සත්ත්ව කෙනෙක් චෛතසික රෝග යෙන් ආරෝග්‍යය පිළිණ කෙරෙත් ද ඒ සත්හු ලෝකයෙහි දුර්ලභ වෙති. රහතුන් හැර යි.

මෙම වර්ගීකරණයට අමතරව මනෝ විකෘතිතා සහ අසාමාන්‍ය චර්යා යනුවෙන් ද පුද්ගලයා තුළ දක්නට ලැබෙන මනෝභාවීය හා චර්යාමය ස්වභාවයන්ගේ යම් යම් වෙනස්කම් වර්ග කර දැක්වීමක් පවතී. පෘථග්ජන පුද්ගලයන් තුළ පවත්නා බොහෝමයක් ලෞකික වස්තූන් කෙරෙහි ඇති ආශාව සහ තණ්හාව හේතුවෙන් ද එය අහිමිවීමෙන් හටගන්නා ශෝකය හෝ ද්වේශය හේතුවෙන් ද පුද්ගලයා අතෘප්තියට පත් වේ. තවද මානසික අසහනයට හා ව්‍යාකූලභාවයකට පත් වේ.

මෙම ස්වභාවයෙන් යුක්තවීම හේතුවෙන් කාලානුරූපීව ක්‍රමයෙන් පුද්ගලයා තුළ විවිධ මානසික හා චර්යාත්මක විෂමතා ඇතිවීම සිදු වේ. මෙය අසාමාන්‍ය චර්යා සහ චින්තනයන් ලෙස හැඳින්විය හැක. එනම්, බෞද්ධ විග්‍රහයානුකූලව පුද්ගලයා නිරන්තරයෙන් මානසික ගැටලුවලට මුහුණදෙනු ඇත. ඒ අනුව පුද්ගලයා තුළ සැමවිට ම කුසල හා අකුසල චේතනාවන් ක්‍රියාත්මකවන අතර ඇතැම්විටෙක ඒවා වංචක ධර්මයෝ ලෙස ද බාහිරට විද්‍යාමාන කෙරේ. මෙමගින් පුද්ගලයා තාවකාලිකව සිය මානසික පීඩාවෙන් හෝ ගැටලුවෙන් නිදහස්වීමක් සිදු වේ.

බුදුදහමෙහි එන පුද්ගලයා පිළිබඳ විග්‍රහයට අනුව පුද්ගලයා නිර්මාණය වී ඇත්තේ නාම - රූප, පංචස්කන්ධය, ද්වාදස ආයතන සහ අට්ඨාරස ධාතූන්ගෙනි. මෙම සියලු කොටස් මූලික පැතිකඩ දෙකක් යටතේ වර්ග කොට දැක්වුවහොත් එහි දක්නට ලැබෙන්නේ නාම හෙවත් මානසික අංශයත් රූප හෙවත් කායික අංශයත් පමණි. විශ්ලේෂණය කොට බැලීමේදී මේ සියල්ල විභජ්ජවාදී සංකල්පයක් ලෙස හඳුනාගත හැකි අතර සත්ත්වයෙකු යැයි සම්මුති සත්‍යයක් නැතැයි යන්න ද ගම්‍ය වේ. එහෙත් එය සංස්ලේෂණය කර බැලීමේදී පුද්ගලයා යනු මේ සියල්ලෙහි ම එකතුවක් බවත් ගම්‍ය කරවයි. ඒ අනුව පුද්ගලයා නිර්මාණය වී ඇත්තේ නාම හෙවත් මානසික අංශයත් රූප හෙවත් භෞතික අංශයත් යන දෙඅංශයේ ම එකතුවක් ලෙසිනි. එනම්, කය සහ මනස අන්‍යෝන්‍ය වශයෙන් පරායත්ත වේ. ඒ අනුව කායික රෝග ඇතිවීම කෙරෙහි පුද්ගලයාගේ කායික අංශය හා සම්බන්ධ ආපෝ, තේජෝ, පඨවි හා වායෝ ධාතුවෙහි අසමතුලිතතාවය යනාදී කායික හේතු මෙන් ම පුද්ගලයා සතු ලෝභය (සෙම), ද්වේශය (පිත), මෝහය (වාත) යනාදී මානසික හේතූන් ද බලපානු ඇත. ඒ අනුව පුද්ගලයා තුළ ඇතිවන අසාමාන්‍ය චර්යාවන් සඳහා මෙවැනි කායික හා මානසික හේතු සහ රෝග යනාදිය බලපානු ලබයි. මෙසේ ඇතිවන කායික හා මානසික රෝග වර්ග පිළිබඳව ත්‍රිපිටකය තුළ බොහෝමයක් සූත්‍ර දේශනාවන් දක්නට ලැබේ. අංගුත්තර නිකායෙහි දසක නිපාතයට අයත් ගිරිමානන්ද සූත්‍රයේ සඳහන්වන පරිදි පුද්ගලයා හට වැළඳෙන කායික රෝග හතළිස් අටක් යැයි (48) හඳුනාගත හැකි වේ. එනම්, "ඉති ඉමස්මිං කායෙ විවිධා ආබාධා උප්පජ්ජන්ති සෙයයථිදං? චක්ඛුරෝගෝ, සොතරෝගෝ, ඝාණරෝගෝ, ජිව්හාරෝගෝ, කායරෝගෝ, සීසරෝගෝ ...."

මීට අමතරව මහා චුන්දත්ථෙර බොජ්ඣංග සූත්‍රය, මහා කස්සපත්ථෙර බොජ්ඣංග සූත්‍රය, මහ මොග්ගල්ලානත්ථෙර බොජ්ඣංග සූත්‍රය වැනි බොහෝමයක් සූත්‍ර දේශනාවන්හී කායික රෝග හටගන්නා ආකාරය පිළිබඳව සඳහන්ව පවතී. එමෙන් ම සූත්‍ර පිටකයෙහි එන මජ්ඣිම නිකායට අයත් සල්ලේඛ සූත්‍රයේ මානසික රෝග හතළිස් හතරක් (44) පිළිබඳව සඳහන් වේ (සොයිසා, 2015). විභංගප්‍රකරණයෙහි මානසික රෝග එක්දහස් පන්සියයක් (1500) පිළිබඳව ද සඳහන් වේ. තව ද රේරුකානේ චන්දවිමල හිමියන්ගේ කෙලෙස් එක්දහස් පන්සියය නම් කෘතියේ පුද්ගලයාහට වැළඳෙන මානසික රෝග එක්දහස් පන්සිය දහයක් (1510) පිළිබඳව කරුණු සඳහන් වේ (චන්දවිමල හිමි, 2016). මීට අමතරව බුද්ධඝෝෂ හිමියන් විසින් රචනා කරන ලද විශුද්ධිමාර්ගය තුළ එන පුද්ගල චරිත විග්‍රහයට අනුව ද ඒ ඒ පුද්ගලයාට වැළඳෙන මානසික රෝග රැසක් හඳුනාගත හැකි වේ (ධර්මවංශ, 2015, පි. 166-174).

බුදුදහමට අනුව පුද්ගලයා නිරන්තරයෙන් කායික හා මානසික ගැටලු ඇති කරගනු ලබයි. පපඤ්චසූදනී අටුවා සාහිත්‍යයට අනුව ද "සබ්බේ පුථුජ්ජනා විය හි උම්මත්තකා" හෙවත් අවම වශයෙන් සෝතාපන්න අනුගාමික මට්ටමට හෝ ළඟා නොවූ සාමාන්‍ය පෘථග්ජන මිනිසුන් කෙලෙස් ප්‍රහීන නොකළ හෙයින් හෝ ඒ පිළිබඳව අවබෝධයක් නැති හෙයින් උම්මත්තකයින් හෙවත් පංචේන්ද්‍රියන් පිනවමින් කෙලෙස් තවමින් නිශ්ඵල ක්‍රියාවන්හී නිරත වෙති. එහි ප්‍රතිඵලයක් වශයෙන් මෙවැනි ගැටලු පදනම් කොටගෙන පුද්ගල ජීවිතයේ ලෞකික සාර්ථකත්වයට මෙන් ම ලෝකෝත්තර සාර්ථකත්වයට බලපෑම් එල්ල වනු ඇත (උපරතන හිමි, 2018). ඇතැම්විට යම් යම් කාරණා මත තාවකාලිකව පුද්ගලයා කෙරෙහි විසඳුම් ලබා දුන්න ද බුදුදහම ඉන් සෑහීමකට පත් නොවනුයේ බෞද්ධ උපදේශනයේ ඒකායන පරමාර්ථය වනුයේ පුද්ගල මානසික ගැටලු මුලිනුපුටා දැමීම හේතුවෙනි. මානසික ගැටලු ඇතිවීමට හේතුවනුයේ ප්‍රධාන වශයෙන් ම පුද්ගල චිත්තයේ පවත්නා ලෝභ, දෝස, මෝහ හෙවත් තණ්හා, දිට්ඨි සහ මාන යනාදි අකුසල මූල හේතුවෙනි. ලෝභය යනු කිසිවෙක්, කිසිවක්, කිසියම් ස්ථානයක් පිළිබඳව හෝ කිසියම් මතයක් පිළිබඳව සිතෙහි ඇති කර ගන්න දැඩි කැමැත්ත, ඇල්ම හෝ දැඩි බැඳීම යි. මෙහිදී පුද්ගලයාට සත්‍ය කුමක්දැයි අවබෝධ කර

ගැනීමට නොහැකි වේ. එනම්. සත්‍ය අසත්‍ය ලෙස ද අසත්‍ය සත්‍ය ලෙස ද සිතෙයි. ඒ අනුව ක්‍රියා කරයි. පුද්ගලයා අන්ධයෙකු බවට පත් කරවනු ලබයි. එවිට එම අරමුණ ම සුඛයකැයි, සත්‍යකැයි සිතා ඒ පිළිබඳව ම තවදුරටත් කල්පනාවෙහි නිරතවෙමින් අදාළ අරමුණ සමඟ දැඩිව මානසිකව බැඳීමක් හෝ ගැටීමක් ඇති කර ගනී. එවිට එහි ඵලවිපාක පිළිබඳව නොවැටහීම, යහපත සහ අයහපත දෑ වෙන් කොට හඳුනා ගැනීමට අසමත් වීම, තම අභිප්‍රායට එකඟ නොවන අය සමඟ ගැටීම යනාදි දෑ සිදු වේ. මෙය ක්‍රමයෙන් ද්වේශයට පරිවර්තනය වීමත් සමඟ පුද්ගලයා කායික වශයෙන් මෙන් ම මානසික වශයෙන් ද සාමාජීය වශයෙන් ද විවිධ ගැටලුවලට මුහුණපායි.

එමෙන් ම මෝහය සහ දිට්ඨිය හේතුවෙන් මුලාවට පත්ව අසත්‍ය සත්‍ය සේ අවබෝධ කරගනු ලබයි. කිසිවක් ගැඹුරින් සොයා නො බලා කළ යුතු දේ වෙනුවට නො කළ යුතු දේ කිරීමටත් කිව යුතු දේ වෙනුවට නො කිවයුතු දෑ පැවසීමටත් පෙළඹේ. මේ නිසා දෙනික කටයුතු කරගෙන යාමට නොහැකිවීමේ තත්ත්වයක් මතු වේ. මේ හේතුවෙන් අසාමාන්‍ය චර්යාවන් සහ චින්තනයන් වර්ධනය වී ඇතැම්විට පුද්ගලයා මානසික රෝගියෙකු බවට පත්වීමට ද හැකියාවක් ඇත. මෙම මානසික ක්‍රියාවලිය පිළිබඳව මජ්ඣිම නිකායේ මූලපණ්ණාසකපාලියට අයත් මධුපිණ්ඩික සූත්‍රය තුළ පපංචකරණය යනුවෙන් හඳුන්වනු ලබයි. මීට අමතරව පුද්ගලයා තුළ ඇතිවන වා, පිත් සහ සෙම් මුලිකවීමෙන් ද ඍතු පරිණාමයෙහි බලපෑමෙන් ද කර්ම විපාක ඵලදීමෙන් ද අසාමාන්‍ය චර්යා ඇති කෙරෙන බව බුදුන්වහන්සේ විසින් විවිධ සූත්‍ර දේශනාවන්හීදී සඳහන් කර තිබේ. එමෙන් ම පන්සිය පනස් ජාතක පොතෙහි එන දරීමුඛ ජාතකයේ සඳහන් පරිදි පුද්ගලයා තුළ ඇතිවන අසාමාන්‍ය චර්යාවන් සඳහා විවිධ මානසික සාධක, අධිභෞතිකවාදී සාධක, ජීවවිද්‍යාත්මක පදනමක් සහිත ශරීර අභ්‍යන්තරික සාධකවල වෙනස්වීම් ද ඇබ්බැහිගත චර්යාවන් ද යම් යම් පාරිසරික හේතූන් ද සංස්කෘතියාබද්ධ කාරණාවන් ද බලපානු ඇත.

ආයුර්වේදයට අයත් කෘතියක් වූ භේසජ්ජමඤ්ජුසාව තුළ සඳහන් පරිදි පුරාණ ලාංකේය බෞද්ධ ජනයාගේ කායික සෞඛ්‍ය ආයුර්වේදය හෙවත් දේශීය වෛද්‍ය ක්‍රමයෙනුත් ඔවුන්ගේ මානසික

ස්වස්ථතාවය ත්‍රිපිටකයෙන් ආරක්ෂා විය (ධර්මකීර්ති හිමි, 1967). ඒ අනුව (ආරෝග්‍යපරමා ලාභා - සන්තුට්ඨී පරමං ධනං - විස්සාසපරමා ඤාති - නිබ්බානපරමං සුඛං) නිරෝගීකම පරම ලාභය බවත් සන්තුට්ඨිය හෙවත් සතුට පරම ධනය බවත් සමාජීය සත්ත්වයෙකු ලෙස ජීවත්වීමේදී අන්‍යයන් අතර විශ්වාසය ගොඩනඟා ගැනීම සහ ඒ ඔස්සේ යහපත් සම්බන්ධතා පවත්වාගෙන යාම මෙන් ම ජාති, ජරා, මරණ, ව්‍යාධි යන ධර්මයන්ගෙන් අත්මිදී චිරස්තිථික අධ්‍යාත්මික සුවය ලබා ගැනීම පරම සුවය බවත් ගම්‍යමාන වේ. මේ අනුව මානසික රෝග හෙවත් අසාමන්‍ය චර්යාවන් ඇතිවන්නේ බහුවිධ කාරණා රැසක බලපෑම හේතුවෙන් බවත් ඉන් මිදීම සඳහා ඒ ඒ අසාමාන්‍ය චර්යාවන්ට ගැළපෙන හා අනන්‍ය පරිදි සාකල්‍යවාදී ප්‍රතිකාර ක්‍රමවේද අනුගමනය කළ යුතු බව හඳුන්වාදිය හැක. ජාතක කතා යනු ඒ සඳහා භාවිතා වූ එක් ක්‍රමවේදයකැයි ද සඳහන් කළ හැකි වේ.

අසාමාන්‍ය චර්යාව පිළිබඳ බටහිර විග්‍රහය

ප්‍රාග් ඓතිහාසික යුගයේ පටන් නූතන යුගය දක්වා මනෝවිද්‍යාව පැමිණි ගමන්මග දෙස බැලීමේදී එහි අසාමාන්‍ය චර්යාවන් සම්බන්ධයෙන් සාකච්ඡාවන කාරණාවන් ප්‍රධාන අවධි කිහිපයක් ඔස්සේ හඳුනාගත හැකි වේ. එනම්, ක්‍රි.පූ 10000 ත් ක්‍රි. පූ 30000 ත් අතර ප්‍රාග් ඓතිහාසික යුගය, ක්‍රි. පූ 800 ත් ක්‍රි.ව 1000 ත් අතර කාලවකවානුව තුළ පැවති ග්‍රීක රෝම ශිෂ්ටාචාරික යුගයත් ක්‍රි. ව 300 ත් 1500 ත් අතර වූ මධ්‍යකාලීන යුගයත් 17, 18, 19 වන සියවස් මෙන් ම නූතන යුගය යනාදිය සඳහන් කළ හැකි වේ (ප්‍රනාන්දු, 2015,පි. 174-188). මෙම එක් එක් යුගවලදී අසාමාන්‍ය චර්යාවන් ඇතිවීම සඳහා විවිධ හේතු කාරණා බලපාන්නට වූ අතර ඒවා නම් අධි ස්වාභාවික හේතු, ජීවවිද්‍යාත්මක හේතු, මනෝවිද්‍යාත්මක හේතු, ළමා කළ අවරෝධිත මතකයන් හා අත්දැකීම්, ශරීර අභ්‍යන්තරික රසායනික වෙනස්වීම් හා හදිසි අනතුරු යනාදිය යි. නූතන වෛද්‍ය විද්‍යාවේ පුරෝගාමියා වශයෙන් සැලකෙන හිපොක්‍රටිස් විසින් පළමුවරට කළු පිත, කහ පිත, රුධිරය සහ සෙම යනාදී ශරීර අභ්‍යන්තරික ධාතුවල වෙනස්වීම් පුද්ගලයාගේ කායික හා මානසික වෙනස්කම් සඳහා බලපාන බව පෙන්වාදෙන්නට වූ අතර පසුකාලීනව ග්‍රීක භෞතචිකිත්සකයෙකු වූ ගැලන් නැමැත්තා විසින් 'මූලධාතු න්‍යාය'

නමින් නව න්‍යායක් ඉදිරිපත් කරන්නට විය. ගැලන්ට අනුව ශරීරයේ ප්‍රධාන මූලධාතු හතර වෙනස්වීම මුල් කොට ගෙන අධික දුක්මුසු ස්වභාවය සහ අඳුරු, විෂාදී මනෝභාවී ස්වාභාවය (melancholic/ Depression), පිත්තාධික බව නිසා ඇතිවන අතිකෝපය (Choleric), ප්‍රසන්න, සුබඅපේක්ෂාසහිත රක්තවර්ණ ස්වභාවය (Sanguine), අලස සෙමාධික ස්වභාවය (Phlegmatic) යනුවෙන් ප්‍රධාන අසාමාන්‍ය චර්යාවන් ඇති කෙරේ.

17, 18, 19 වන සියවස්වල ක්‍රමික වර්ධනීය විකාශය සමඟ වෛද්‍ය විද්‍යාව හා පර්යේෂණාත්මක අංශයෙහි දියුණුවත් සමඟ පුද්ගල චර්යාවේ අසාමාන්‍යතා පදනම් කරගෙන අසාමාන්‍ය මනෝවිද්‍යාව නම් විෂය ක්ෂේත්‍රයක් වර්ධනය වේ. මෙහි ක්‍රමික විකාශනයට අනුව කය සහ මනස අතර සම්බන්ධතාවය සාකච්ඡා කරන්නට විය. එනම්,



ඒ අනුව වර්තමානය වනවිට මෙම ප්‍රපංචයන් දෙක මත පදනම්ව ප්‍රධාන වශයෙන් බටහිර රෝග තත්ත්වයන් රැසක් හඳුනාගත හැකි වේ (ප්‍රනාන්දු, 2017). එනම්,

i. **කාංසා ගණයට අයත් අක්‍රමතා** - (Anxiety Disorders)

- කාංසාව (Anxiety) – කාංසාව යනු අධික බිය සහ කනස්සලු ස්වභාවය පෙන්නුම් කිරීමේ තත්ත්වයකී ඇතැම් විටෙක මෙම ස්වභාවය හේතුවෙන් පලායාම හෝ පහරදීම වැනි චර්යාත්මක

ප්‍රතිචාරයන් පෙන්නුම් කෙරේ මෙම ස්වාභාවය යම් යම් වස්තූන්, ස්ථාන, අවස්ථාවන් හෝ පුද්ගලයන් කෙරෙහි වුවද ඇතිවිය හැකියි

■ ග්‍රස්තීය අනිවාර්යතා අක්‍රමතාව (Obsessive Compulsive Disorder - OCD) මෙම තත්ත්වයේහී පුද්ගලයාට පාලනය කළ නොහැකි අන්දමින් නැවත නැවත සිතුවිලි හෝ හැසිරීම් හෝ ඒ දෙකම අත්විඳින ස්වභාවයක් දක්නට ලැබේ මෙහිදී පුනර් සිතිවිලි ආක්‍රමණශීලී, අනවශ්‍ය, පීඩාකාරී, නොනවතින සිතුවිලි, පෙළඹවීම් සහ රූප ලෙසින් ද එම සිතිවිලිවලින් ඇති කෙරෙන ආතතිය මඟහැරවීමේ ප්‍රතිඵලයක් ලෙස පුනර් චර්යාවන් ද ඇති කෙරේ (සිල්වා, 2015)

■ සරල විශාදය (Mild Depression) - සරල විශාදය යනු පුද්ගලයාගේ දෛනික ක්‍රියාකාරිත්වයට, චිත්තවේග යන්ට, සංජානනයට සහ හැසිරීමට ඍණාත්මකව බලපාන සුලභ මානසික අක්‍රමතාවයකී බොහෝ වෙලාවට මෙවැනි පුද්ගලයින්ට අවධානය යොමු කිරීමට නොහැකි වීම, තමන් කිසි වටිනාකමක් නැති බව සිතීම හෝ අධික වරදකාරි හැඟීම, ශාරීරික වේදනාවන් කිහිපයක් පැවතීම, බර අඩු වීම හෝ වැඩිවීම, අධික නින්ද හෝ අනින්ද්‍රාව හෝ නින්දේ රටාව වෙනස්වීම, ශරීර ශක්තිය හා උනන්දුව නොමැතිකම දැකිය හැකි වේ

■ භීතිකා (Phobia) - භීතිකාව යනු යම්කිසි ස්ථානයකට, පුද්ගලයෙකුට, යම්කිසි වස්තුවකට හෝ සත්ත්වයෙකුට යථාර්ථවාදී නොවන අහේතුක බියක් ඇති කිරීමේ කාංසාමය ස්වාභාවය යි (රණවක සහ හපුආරච්චි, 1996)

■ පශ්චාත් ව්‍යසන ක්ලමථ අක්‍රමතාව (Post Traumatic Stress Disorder - PTSD) - මෙම තත්ත්වයේදී පුද්ගල ජීවිතයේ පෙර සිදු වූ අමිහිරි අත්දැකීමක්, සිදුවීමක් හෝ ව්‍යසනයක් වැනි දෙයක් නිතර නිතර දර්ශනයවීමට හෝ චිත්තවේගීයමය

වශයෙන් විෂාදිත තත්ත්වයකට පත් වේ (සිල්වා, 2015).

■ ii. සයිකෝෂීය - උග්‍ර මානසික රෝග (Psychotic Disorders)

■ භින්නෝන්මාදය (Schizophrenia) - භින්නෝන්මාදය යනු යථාර්ථය වටහා ගැනීමේ දුර්වලතා සහිත සංකීර්ණ, නිදන්ගත මානසික රෝගයකි. එය දැන් වර්ණාවලි ආබාධයක් ලෙස හඳුනාගෙන ඇති අතර, එය මේ හා සමාන මානසික ආබාධ සමඟ අඛණ්ඩව පැමිණෙන බව පෙන්නුම් කරයි (හපුආරච්චි සහ රණවක, 1996).

■ ද්විධ්‍රැව මනෝභාව අක්‍රමතාව (Bipolar Affective Disorder) මෙහිදී කාලානුරූපීව දින, සති, මාස සහ වර්ෂ වශයෙන් වරින්වර උන්මාද තත්වය සහ විශාදය මට්ටම අඩු වැඩිවීමක් සිදු වේ.

■ උග්‍ර විශාදය (Sever Depression) - මෙම තත්ත්වයේදී සාමාන්‍ය සරල විශාදීය මට්ටමට වඩා බරපතල ස්වාභාවයක් දක්නට ලැබේ. එනම්, ඉච්ඡාභංගත්වය හේතුවෙන් දීර්ඝ කාලයක් තිස්සේ පවතින් අධික දුක, වේදනාව හේතුවෙන් දැඩිව මානසික අවපීඩනයකට ලක්වී පංචේන්ද්‍රියන්ගෙන් හටගන්නා සංවේදනයන් සහ ආවේග ආදී සියල්ල ම පහත වැටීමක් සිදු වේ. ඇතැම්විට සියදිවි හානි කර ගැනීම සඳහා ද මෙම තත්තවය හේතුවිය හැක (සිල්වා, 2015).

■ උන්මාදය (Mania) - මෙහිදී අධික ප්‍රීතියකින් හා උද්යෝග යකින් යුතුව අපරික්ෂාකාරී සහ අවධානම් සහගත චර්යාවන් සිදු කෙරේ.

මෙම ප්‍රධාන රෝග ප්‍රභේද ද්විත්වයට අමතරව පුද්ගලයාට වැළඳෙන රෝග අතර පෞරුෂ අක්‍රමතා, ලිංගික අක්‍රමතා, මනෝ කායික ආබාධ, ස්නායු ක්‍රියාකාරීත්වය හා සම්බන්ධ මානසික රෝග යනාදිය ද සුවිශේෂී වේ.

පර්යේෂණ ගැටලුව

ජාතක පොතේ ආඛ්‍යාන සහ මානසික අක්‍රමතා පිළිබඳ රෝග විනිශ්චය සහ සංඛ්‍යානමය දත්ත අත්පොතෙහි දක්වා ඇති රෝග විනිශ්චය වර්ගීකරණයන් අතර අසාමාන්‍ය හැසිරීම් නිරූපණය කිරීමේ සමානකම් සහ වෙනස්කම් මොනවාද?

පර්යේෂණ අරමුණු

i. ජාතක කතා පොතෙහි සඳහන් මානසික අක්‍රමතා සහ රෝග හඳුනාගැනීම.

ii. ජාතක පොතෙහි සඳහන් මානසික රෝග සහ බටහිර මානසික රෝග විග්‍රහයෙහි පවතින සමවිෂමතා විමසමින් එය සංසන්දනාත්මකව අධ්‍යයනය කිරීම.

පර්යේෂණ ක්‍රමවේදය

අධ්‍යයනය සඳහා අවශ්‍ය ශාස්ත්‍රීය සහ න්‍යායාත්මක තොරතුරු ලබා ගැනීමේදී පුස්තකාල පරිශීලනයෙන් ලබා ගන්නා ලද ප්‍රාථමික මූලාශ්‍රයවන බුදුදහමේ විවරණ සාහිත්‍යයට අයත් සිංහල ජාතකට්ඨ කතාව, පන්සිය පනස් ජාතක පොත ද ද්විතීක මූලාශ්‍රය ලෙස සැලකෙන ඒ සම්බන්ධයෙන් ලියැවුණු වෙනත් බෞද්ධ හා මනෝවිද්‍යාත්මක කෘති මෙන් ම තෘතීයික මූලාශ්‍රය ලෙස සැලකෙන බටහිර මනෝවිද්‍යාවෙහි මානසික රෝග වර්ගීකරණ අත්පොත් සහ කෘතීන් අධ්‍යයනය කිරීම තුළින් විස්තරාත්මක සහ ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදයක් ඔස්සේ මෙම පර්යේෂණය සිදු කරන ලදි.

පර්යේෂණයේ වැදගත්කම

අසාමාන්‍යතාවයක් යනු පුද්ගලයෙකුගේ සංජානනය, චිත්තවේගීය නියාමනය හෝ හැසිරීම් වල සායනික මට්ටමින් සැලකිය යුතු වෙනස්කමකි. එය පුද්ගලයාගේ දෛනික ක්‍රියාකාරීත්වයේ තීරණාත්මක වෙනස්කම් හෝ දුර්වලතා ඇති කිරීම කෙරෙහි ද හේතු වේ. මේ අනුව විවිධ ආකාරයේ මානසික හා චර්යාත්මක අක්‍රමතා රැසක් හඳුනාගත හැකි වේ. අනෙක් අතට, මානසික අක්‍රමතා යන්න

මානසික සෞඛ්‍ය පිරිහීමේ තත්ත්වයක් ලෙස ද හැඳින්විය හැකි වේ. නීරෝගී පුද්ගලයෙකු බිහිවීම සඳහා කායික, මානසික, සමාජීය සහ අධ්‍යාත්මික යනාදි සියලු මානයන් ධනාත්මක ස්වභාවයෙන් පැවතිය යුතුය. එහෙත් නූතන සංකීර්ණ සමාජ සන්දර්භය තුළ දිවිගෙවන මිනිසාගේ කාර්යබහුල හා කෘතිම ජීවන රටාව දෙස බලනවිට උක්ත බහුවිධ මානයන් දැඩි ලෙස අර්බුදයන්ට ලක්වී ඇති ආකාරයක් දැකගත හැකි වේ. වර්ෂ 2019 දී, සෑම පුද්ගලයින් අට දෙනෙකුගෙ න් එක් අයෙක් හෝ ලොව පුරා මිලියන 970 ක ජනතාවක් මානසික අක්‍රමතා සමඟ ජීවත් වන අතර, කාංසාව සහ විශාදය ඒ අතුරින් බහුලව දක්නට ලැබේ (WHO, 2013-2030). මෙය අතීතයේදී ද පැවති සාමාන්‍ය ස්වභාවයක් වන අතර අතීතයට සාපේක්ෂව වර්තමාන සහ අනාගත වනවිට තවදුරටත් සෘණාත්මක හා සංකීර්ණ ස්වරූපයකින් යුක්ත වනු ඇතැයි පර්යේෂණ සොයා ගැනීම් මගින් අනුමාන කෙරේ. බටහිර මනෝවිද්‍යා සාහිත්‍ය තුළ මෙවැනි තත්ත්වයන් සම්බන්ධයෙන් විද්‍යාත්මක පදනමකින් යුතුව කතා කිරීමට මානසික අක්‍රමතා පිළිබඳ රෝග විනිශ්චය හා සංඛ්‍යා දත්ත අත්පොත (DSM : Diagnostics and Statistical Manual of Mental Disorders) යන්න භාවිත කෙරේ.

පන්සිය පනස් ජාතක පොත් වහන්සේ යනු ලොව ඉපැරණි ම මානසික රෝග කාර්යය සංග්‍රහය හෙවත් (The Ancient DSM) අත්පොත ලෙස නූතන පිළිගැනීමක් පවතී (රණතුංග, 2015). මෙයට හේතුව වනුයේ බෞද්ධ ජාතක කතාවල තිබෙන ඒවා ඇසීමෙන් හා කියවීමෙන් මිනිසුන්ගේ සිත් සුවපත් කිරීමට සමත් ස්වභාවය යි. "ජාතක පොත" සහ "මානසික අක්‍රමතා පිළිබඳ රෝග විනිශ්චය සහ සංඛ්‍යානමය දත්ත අත්පොතෙහි" අසාමාන්‍ය හැසිරීම් පිළිබඳ සංසන්දනාත්මක අධ්‍යයනය මගින් ජාතක පොතෙහි ආඛ්‍යානවල අසාමාන්‍ය හැසිරීම් නිරූපණය කෙරෙන ආකාරය සහ සමකාලීන මනෝචිකිත්සක රෝග වර්ගීකරණය සමඟ ඇති සමානකම් සහ අසමානකම් පිළිබඳව, ඒ ඒ අසාමාන්‍ය චර්යාවන්ගේ ස්වාභාවය පිළිබඳව පැහැදිලි අදහසක් ලබා දෙයි. එමෙන් ම මේ සම්බන්ධයෙන් දැනට සිදු කර ඇති ශාස්ත්‍රීය පර්යේෂණ ඉතා විරල බැවින් මේ පිළිබඳ අධ්‍යයනය බෞද්ධ මනෝවිද්‍යාත්මක පැතිකඩයන්ගෙන් ද අසාමාන්‍ය මනෝවිද්‍යාව පිළිබඳ දැනුම පොහොසත් කිරීම සහ මානසික සෞඛ්‍ය සේවාවන්හි සංස්කෘතික නිපුණතාවය පෝෂණය කිරීම සඳහා ද දායකත්වය සපයනු ලබයි.

සාකච්ඡාව

ශ්‍රී ලාංකේය බෞද්ධ සාහිත්‍යාංගයක් වන පන්සිය පනස් ජාතක පොතෙහි අන්තර්ගත කතා පුවත් ඇසුරෙන් මානසික රෝග විෂයය පිළිබඳව ගැඹුරින් විමසා බැලීමේ දී නූතන මනෝවිද්‍යාවෙහි සාකච්ඡාවන මනෝ රෝග රාශියක් දැකගත හැක ය. ආතතිය, විශාදය, කාංසාව, ලිංගික අක්‍රමතා, භීතිකා, පෞරුෂය අක්‍රමතා ඉන් කිහිපයකි. එමෙන් ම ජාත්‍යන්තර මනෝරෝග වර්ගීකරණයන්හි දක්නට ලැබෙන මානසික රෝග සහ අක්‍රමතාවන්ගෙන් බහුතරයක් ජාතක කතා පොතෙහි දක්නට ලැබේ. ඒ අනුව මානසික රෝග පිළිබඳව ඉදිරිපත්ව ඇති පැරණිතම බෞද්ධ වර්ගීකරණය පන්සිය පනස් ජාතක පොතෙහි සඳහන් "දරිමුඛ ජාතකය" ලෙසින් දැක්විය හැක ය. බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජුගේ පුරෝහිතයන්ගේ පුත්‍රයා වන දරීමුඛ නැමැත්තා සිය ලෞකික ජීවිතය අත්හැර භාවනාවේ ම නියැලෙමින් පසේ බුද්ධත්වය ලබාගන්නට විය. නැවත ඔහු සිය මිත්‍රයා වන බරණැස් රජු දැකීමට පැමිණි අවස්ථාවේ රජු විසින් සංසාරය නැමති සිරගෙයින් නික්ම යා හැකි මඟක් පිළිබඳව විමසා සිටි අවස්ථාවේදී ඊට පිළිතුරු ලෙස සත්ත්වයා තුළ ලෝභ, ද්වේශ සහ මෝහ යනාදි කෙලෙස් ඇතිවීමෙන් හටගන්නා උන්මාද තත්වයන් අටක් පිළිබඳව ඉදිරිපත් කරන ලදි. එනම්, "මෝහයෙන් උපන්නා වූ කාම උන්මාදය, අනිෂ්ට විනාශයෙන් උපදනා වූ ක්‍රෝධ උන්මාදය, සංඥා හේතුවෙන් ඇතිවන දර්ශන උන්මාදය, අඥානභාවයට හේතුවෙන් ඇතිවන මෝහ උන්මාදය, යක්ෂයන් වසඟයට පමුණුවන හෙයින් ඇතිකෙරෙන යක්ෂ උන්මාදය, පිත්ත අධික බව හේතුවෙන් ඇතිවන පිත්තෝන්මාදය, පාන වසඟ කරවන සුරා උන්මාදය, සෝක අධිකවීමෙන් වන ව්‍යසන උන්මාදය යයි ...." දැක්විය හැකිය. (කරුණාතිලක, 2005).

මෙහි සඳහන් කාම උන්මාදය ද, මෝහ උන්මාදය ද, ක්‍රෝධ උන්මාදය ද, ව්‍යසන උන්මාදය සහ දර්ශන උන්මාදය යන්න යම් යම් රෝග ලක්ෂණ මත පදනම්ව නිර්මාණයවන අතර යක්ෂ උන්මාද, පිත්ත සහ සුරා උන්මාද යන්න කිසියම් රෝග නිදානයක් සහිතව ආරම්භවන ස්වාභාවයක් ජාතක කතා පොතෙන් පෙන්වාදෙයි.

i. කාම උන්මාදය (Sexual Dysfunction / Paraphilic)

රාගය, ආශාව, දැඩිව පවත්නා ඇල්ම හෙවත් ලෝභය යනු කිසිවෙක්, කිසිවක්, කිසියම් ස්ථානයක් පිළිබඳව හෝ කිසියම් මතයක් පිළිබඳව සිතෙහි ඇති කර ගන්න දැඩි කැමැත්ත හෝ දැඩි බැඳීම යි. මෙහි දී පුද්ගලයාට සත්‍ය කුමක්දැයි අවබෝධ කර ගැනීමට නොහැකි වේ. එනම්. සත්‍ය අසත්‍ය ලෙස ද අසත්‍ය සත්‍ය ලෙස ද සිතෙයි. ඒ අනුව ක්‍රියා කරයි. පුද්ගලයා අන්ධයෙකු බවට පත් කරවනු ලබයි. එවිට එම අරමුණ ම සුබයකැයි, සත්‍යකැයි සිතා ඒ පිළිබඳව තවදුරටත් කල්පනාවෙහි නිරතවෙමින් අදාළ අරමුණ සමඟ දැඩි ලෙස මානසිකව බැඳීම හෝ ගැටීම සිදු වේ. එවිට එහි ඵලවිපාක පිළිබඳව නොවැටහීම, යහපත සහ අයහපත වෙන් කොට හඳුනා ගැනීමට අසමත් වීම, තම අභිප්‍රායට එකඟ නොවන අය සමඟ ගැටීම යනාදි දෑ සිදු වේ. එනම්, තම පෞද්ගලික සතුට හා සැපය වෙනුවෙන් තෝරා ගන්නා ඕනෑ ම දෙයක් තමාට අභිමත පරිදි හෝ තමාගේ සන්තකයේ ම පැවතිය යුතුය යනුවෙන් අපේක්ෂා කිරීම යි.

පන්සිය පනස් ජාතක පොතෙහි එන බොහෝමයක් කතා පුවත්වල ද මෙවැනි අධික ආශාවන් නිසා ඇති වූ ගැටලු පිළිබඳව ඉදිරිපත් වේ. රාගය නැතහොත් ලිංගික ආශාව සහ විකෘති ලිංගික ආශාවන් යනු එයට නිදසුනකි. බටහිර අසාමාන්‍ය මනෝවිද්‍යා සාහිත්‍ය තුළ ද ප්‍රධාන වශයෙන් ම මනෝ ලිංගික අක්‍රමතා සහ පැරාෆීලියා යනුවෙන් ලිංගික අක්‍රමතා වර්ග දෙකකි. ලිංගික අක්‍රමතා යනු ලිංගික තෘප්තිය හා සම්බන්ධයෙන් ඇතිවන ගැටලුකාරී තත්වයන් මත පදනම් වූ රෝග ය. පැරාෆීලියා යනු ලිංගික තෘප්තිය ලබා ගැනීම සඳහා සමාජ සම්මතයෙන් ඔබ්බට ගිය පරිබාහිර ක්‍රමවේදයන් යොදා ගැනීමේ තත්ත්වයකි. පන්සිය පනස් ජාතක පොතෙහි එන කුණාල ජාතකයෙහි සඳහන් පරිදි පුද්ගලයා තුළ පවත්නා ප්‍රබල හා අසාමාන්‍ය ලිංගික උත්තේජය සහ එය තෘප්ත කර ගන්නා ආකාරයෙන් එම පුද්ගලයාට ම සිදුවන කායික, මානසික සහ සමාජීය හානිය ප්‍රකට වේ. එමෙන් ම මෙහි අතුරු කතා පුවත් රැසක් අන්තර්ගතවන අතර ඒ තුළින් අපගාමී ලිංගික චර්යාවන් රැසක් පිළිබඳ තොරතුරු අනාවරණය වේ (හරිශ්චන්ද්‍ර, 2015). එනම්, අධික කාමාශාවෙන් යුක්තවීම, ලිංගික හැසිරීම් සැඟවී බලා සිටීම, ලිංගිකත්වය ප්‍රදර්ශනය කිරීම, කණ්ඩායම් ලිංගික හැසිරීම්, ආබාධිතයින් සමඟ ලිංගිකව හැසිරීම යනාදිය හඳුනාගත හැකි වේ (අමරකෝන්, 2011).

කසීරට බ්‍රහ්මදත්ත රජුගේ කි්‍රෂ්ණා නම් දියණිය වැඩිවිය පැමිණීමෙන් පසුව කුමාරවරුන් කිහිපදෙනෙකුට එක්වර ම විවාහ කර දුන් පසුව ඇය ඔවුන්ගෙන් ද සෑහීමකට පත් නොවී රජවාසලේ ආරක්ෂාව සපයන පුද්ගලයෙකු සමඟ ද දිනපතා ම ලිංගික සහවාසයේ යෙදීම ඉන් එක් පුවතකි (කරුණාතිලක, 2005). බරණැස් නුවර පණ්ඩිත පාලිනී නම් උග්‍ර තපස් සුවයෙන් සිටි කාන්තාවගේ තපස් බිඳ එක් පුද්ගලයෙකු ඇය සමඟ සංවාසයේ යෙදී දරු ගැබක් ද ලබාදීම තවත් පුවතකි (කරුණාතිලක, 2005). ඒකළ රජුගේ බිසව වන කුරහවී නම් ස්ත්‍රිය ජලග නම් සෙනෙවියා සමඟ ද තමාට රන් ආභරණ රැගෙන එන අතවැසියා සමඟ ද මහමග වැඩ සිටින බ්‍රහ්මණයෙකු සමඟ ද ලිංගික කාර්යයෙහි යෙදෙන්නට වීම පිළිබඳව තවත් කතා පුවතකි (කරුණාතිලක, 2005). කඩාරි රජුගේ බිසව වූ කින්නරාදේවිය සිය ස්වාමියා සමඟ රාත්‍රියෙන් අඩක් නිදා සිට රජුට නින්ද ගිය පසු රජවාසල තුළට නැමී ඇති දඹ ගයෙහි අත්ත දෙගෙහි රජවාසලෙන් පිටතට ගොස් එම ගස පාමුල නිදා සිටින හිඟන්නා සමඟ ද අභිරමණයේ යෙදී නැවත පැමිණ නිදාගන්න ආකාරය පිළිබඳව තවත් පුවතකි (කරුණාතිලක, 2005).

බක රජු වෙස්වලාගෙන් වීදි සංචාරයෙහි යෙදෙන අවස්ථාවක දුටු පංචපාපා නැමති ස්ත්‍රිය ක්‍රමයෙන් සිය බිසව ලෙස විවාහා කර ගන්නා අතර ඒ පිළිබඳව අනෙක් බිසෝවරු අප්‍රසාදයට පත්ව ඇයට බොරු චෝදනා එල්ල කොට මාළිගයෙන් නෙරපා දමයි. අනතුරුව ඇය නැවත වෙනත් රජෙකු සමඟ විවාහා වූ පසු දැන බක රජුට ඇය නැවත ලබා ගැනීම සඳහා අවශ්‍යයි විය. ඒ සඳහා යුද වැදීම වෙනුවට සතියක් හැර සතියක් රාජ්‍ය දෙකෙහි ම ජීවත්වීමට එකඟ විය. එහිදී ඇයව එගොඩ මෙගොඩ රැගෙන යන ඔරුවෙන් රැගෙන යන මහලු, කබර සහිත, කොර පුද්ගලයා සමඟ ද ලිංගික සංවාසයේ යෙදීම පිළිබඳව තවත් පුවතකි (කරුණාතිලක, 2005). එමෙන් ම අසාතමන්ත ජාතකයෙහි කාමපරිදාහයෙන් දැවුණු වයෝවෘද්ධ කාන්තාවක් කාම ආශාව හේතුවෙන් තම කුසින් ම උපන් පුතු ඝාතනයට පෙළඹවීමක් ඇතිවන ආකාරය දන්කට ලැබේ. මෙහි වර්තමාන පුවතෙහි සිටින භික්ෂුව කාන්තාවක් කෙරෙහි ඇතිවන ඇල්ම පදනම් කරගෙන පෙන්නුම් කෙරෙන කායික හා මානසික ලක්ෂණයන්ගෙන් කාම ආශාව කෙතරම්දුරට පුද්ගලයාට බලපාන්නේදැයි අවබෝධ කරගත

හැක (කරුණාතිලක, 2005). "…. එතැන් පටන් රෝගී වූයේ, පඬුවන් පාට ගැන්වූයේ, මුවෙකු මෙන් භ්‍රාන්තියට පත්වූයේ, කෘශ වූයේ, ධමනි අක්‍රිය වූයේ, සුදුමැළි වූයේ, මහණකමෙහි නො ඇලුණේ, ආචාර්ය උපාධ්‍යායවන් ආදිය හැර කමටහන් නොවඩා උකටලීව කල් ගත කළේය." පණ්ණික ජාතකයේදීත් තම ලෙයින් උපන් දියණියගේ පවිත්‍රත්වය පිරික්සනු යැයි පියා විසින් ම ඇයගේ අකමැත්තෙන් ලිංගික සංවාසයේ යොදා ගනු ලබයි. අන්ධභූත ජාතකයේදීත් කාමයට ලොල් තැනැත්තියක් කුස තුළ පටන් ම ආරක්ෂා කළ ද අර්ථශූන්‍ය බව පෙන්වාදෙයි. බන්ධන මොක්ඛ ජාතකයේදීත් බ්‍රහ්මදත්ත රජු සතුරු ආක්‍රමණයක් මැඩලීම සඳහා දුර බැහැරක ගිය විට තොරතුරු දන්වා එවන රාජපුරුෂයන් හැට හතර දෙනෙකු සමඟ බිසව ලිංගික ක්‍රියාවෙ යෙදුණු ආකාරය පිළිබඳ පුවතක් ඉදිරිපත් වේ. මූල පලෝභන ජාතකය හෙවත් සංකප්ප ජාතකය තුළ කම්සැප හේතුවෙන් පුරුෂයන් සියල්ල ම සියතින් ම ඝාතනය කරන ලද අසනිඝාත කුමාරයා පිළිබඳව සඳහන් වේ. මේ තුළින් තමා අත්විඳී ලිංගික සතුට වෙනකෙකුට අත්වීමට නොදිය යුතුය. ඉන් ලිංගික ඊර්ෂ්‍යාව යන මානසික තත්ත්වය හඳුනාගත හැක. මීට අමතරව බාහිය ජාතකයේ සඳහන්වන පරිදි බටහිර මනෝවිද්‍යාවට අයත් විකෘති ලිංගික ආශාවන් වන මළපහ කිරීමත් ලිංගික ආශාවන් ඇතිවීම (Coprophilous) , මුත්‍රා කිරීම දැකීමෙන් ලිංගික ආශාව ඇතිවීම (Europhilia), තරබාරු කාන්තාවන් කෙරෙහි පමණක් ලිංගික ආශාවන් ඇතිවීම (Partial Fetishism) යනාදිය දක්නට ලැබේ (අමරකෝන්, 2011)1. තව ද ඉතිපිසෝ ජාතකයෙහි විරුද්ධ ලිංගික වෙස් ගැනීම (Transsexualism) පිළිබඳවත් කච්ඡප ජාතකයේ මුඛ සංසර්ගය හා කර්ණ සංසර්ගය (Oral sex and Aural Sex) පිළිබඳවත් උදයභද්‍ර ජාතකයේ නෂ්ටකාමය (Impotency) පිළිබඳවත් කතා පුවත් අන්තර්ගත වේ (අමරකෝන්, 2011).

මේ අනුව උක්ත ජාතක කතාවන් ඔස්සේ ද බටහිර සම්ප්‍රදායෙහි සාකච්ඡා කෙරෙන අසාමාන්‍ය හා විකෘති ලිංගිකත්වයෙහි ගැටලු පිළිබඳව විද්‍යාමාන වේ. ලිංගිකත්වය පිළිබඳව ඇතිවන මෙවැනි මානසික ස්වභාවයන් විසින් පුද්ගල මානසික සෞඛ්‍යයට මෙන් ම කායික සෞඛ්‍යයට ද ප්‍රබල ලෙස බලපෑම් ඇති කරන අතර එය පුද්ගල අභ්‍යන්තරික විකෘතීන්ට ඍජුව බලපායි. එමෙන් ම මෙවැනි පුද්ගලයින් නිසා සමාජ යහපැවැත්මට මෙන් ම පවුල් සංස්ථාවට

ඇතිවන බලපෑම ඉතා ඉහළය. එනම්, ළමා අපචාර, ස්ත්‍රී දූෂණ, ගෘහස්ත ප්‍රචණ්ඩත්වය, ඝාතන හා දේපල හානිවීම් වැනි විවිධාකාර අර්බුදයන් කාමෝන්මාදය හේතුවෙන් ඇතිවිය හැක (හරිශ්චන්ද්‍ර, 2015).

ii. ක්‍රෝධ උන්මාදය (Mood Disorders / Personality Disorders)

පුද්ගලයා සම්මුතික ලෝකය තුළ පවතින යම් යම් වස්තූන් මම ය මාගේ ය මගේ ආත්මයමැයි ලෙස දැඩිව අල්වා ගැනීමෙන් තාවකාලික මානසික සහනයක් ලබයි. එහෙත් එම එක් එක් වස්තූන් අහිමිවීම හෝ ඈත්වීමත් සමඟ එම පුද්ගලයා ම ඒ පිළිබඳව ම දුකක් හෝ වෛරයක් ගොඩනඟා ගැනීමට පෙළඹේ. මෙලෙස එම මානසිකත්වය ක්‍රමයෙන් ද්වේශයට පරිවර්තනය වීමත් සමඟ පුද්ගලයා කායික වශයෙන් මෙන් ම මානසික වශයෙන් ද සාමාජීය වශයෙන් ද විවිධ ගැටලුවලට මුහුණපායි. ක්‍රෝධය යනු එක්තරා අන්දමකින් පුද්ගලයා තුළ දක්නට ලැබෙන පෞරුෂය අක්‍රමතාවයකි. මෙවැනි අක්‍රමතා රැසක් ජාතක කතා පොතෙහි සඳහන්ව ඇති අතර දේවදත්ත චරිතය වූ කලී පෞරුෂ ආබාධ සහිත අයෙකු සඳහා සංනිදර්ශනයකි. චුල්ල ධර්මපාල ජාතකයෙහි එන මහා ප්‍රතාප රජු තමා රාජ සභාවට පැමිණෙන විට තම බිරිඳ අසුනෙන් නැගිට නොසිටියේ යැයි ඊට දඬුවම ලෙස සිය දරුවා හිස ගසා මරා දැමීමට නියම කරන්නට වීමත් ඛණ්ඩහාල ජාතකයේ එන දේවදත්ත ස්ථවිර තමාට භික්ෂු පිරිස පාලනය කිරීමට අවස්ථාවක් ලබා නොදීම හේතුවෙන් බුදුරදුන් සමඟ උරණ වී බුදුන් මැරීමට දුනුවායන් යෙදවීම, ඇතෙකු කුලප්පු කරවා එවීම, ගල් පෙරලීම සහ සංඝභේදය ඇති කිරීම වැනි දෑ සිදු කරන්නට විය. මෙහි අතීත කතා පුවතෙහි ද ඛණ්ඩහාල නම් පුරෝහිතයාව සිට ඒකරාජ රජුගේ පුත් චන්ද්‍ර කුමරු සමඟ වෛරයෙන් මහරජු රවටා පවුලේ සියල්ල ම එක්වර මරාදැමීමට සැලසුමක් සකස් කරන්නට විය.

මින් ගම්‍ය වනුයේ ක්‍රෝධය සහ බද්ධ වෛරස නිසා පුද්ගලයා අනුන්ගේ මෙන් ම තමාගේ ම විනාශය ළඟා කර ගනු ලබයි. මේ සියල්ලට ම හේතුවනුයේ කුඩා කළ පටන් හෝ පසුකාලීනව වර්ධනය

වන පෞරුෂ ආබාධයන් ය. එනම්, ඉහත සඳහන් බොහෝමයක් කතා පුවත්වල දක්වා ඇති පරිදි ක්‍රෝධය හට ගෙන ඇත්තේ ඒ ඒ චරිතයන්ට තම අභිප්‍රායන් එලෙස ම ඉටු කර ගැනීමට ඉඩ නො ලැබී යාම යි. ඒ තුළින් තම චිත්ත අභ්‍යන්තරයේ ඇතිවන ඉච්ඡාභංගත්වය හා පරාධීන බව, හීනමානය, අඩු ආත්ම විශ්වාසය වැනි කාරණා ඉස්මතුව එය නිවැරිදි කර ගැනීම වෙනුවට වෛරය ගොඩනගා ගෙන නොයෙක් හානි පමුණුවමින් තමාට ද හානි පමුණුවා ගනිමින් ජීවත් වේ. ක්ෂාන්තිවාදී ජාතකය ද මෙයට කදිම නිදසුනකි. මෙහි එන කසබු නම් රජු ආවේගශීලී, සමාජ විරෝධී පෞරුෂ ආබාධයකින් යුක්ත අයෙකි. මේ නිසා ම කිසිදු විමසීමකින් තොරව තම පරිවාර ස්ත්‍රීන් සමඟ කතා කරමින් සිටි ක්ෂාන්තිවාදී බ්‍රහ්මණයා හට පීඩා කොට ශරීරාංග කපා දමමින් මරණයට පත් කරයි. නූතනයේ ද හදිසි කෝපය නිසා ඉතා විශාල සංඛ්‍යාවක් සිරගතව පීඩාවිදියි. බටහිර විග්‍රහය තුළ ද මෙම තත්වය නාසිස්ම හා සමාජවිරෝධී පෞරුෂ තුළින් සාකච්ඡා කෙරේ.

iii. දර්ශන උන්මාදය (Schizophrenia Spectrum and Other related Disorders)

මෙහිදී යම් යම් මායාත්මක දෑ මවා පෙන්වීමට කටයුතු කිරීම හා අන්‍යයන් සැක කිරීම, කිසියම් චර්යාවක් පුරුද්දක් සේ දිගින් දිගට ම සිදු කිරීම වැනි තත්ත්වයන් දක්නට ලැබේ. ඒ අනුව ජාතක කතා පොතෙහි සඳහන් බන්ධන මොක්ඛ ජාතකය මේ සඳහා නිදසුනකි. එහි දී රජු යුද්ධයක් සඳහා බැහැරට ගිය පසු තොරතුරු දන්වා එවන රාජ පුරුෂයින් හැට හතර දෙනෙකු සමඟ ලිංගික සහවාසයේ යෙදීම ත් රජු බිරිදගෙන් වරයක් ඉල්ලන්නැයි කියූවිට අන් ස්ත්‍රීන් දෙස නොබලන්නැයි නිතර ම පැවසීම යනාදිය තුළින් දර්ශන උන්මාදී ස්වරූපයක් දිස් වේ.

iv. මෝහ උන්මාදය (Mental Retardation or Developmental Disorder)

මෝහය හෙවත් දිට්ඨිය හේතුවෙන් මුලාවට පත්ව පුද්ගලයා අසත්‍ය සත්‍ය සේ අවබෝධ කරගනු ලබයි. කිසිවක් ගැඹුරින් සොයා නො බලා කළ යුතු දේ වෙනුවට නො කළ යුතු දේ කිරීමට

පෙළඹේ. මේ නිසා දෛනික කටයුතු කරගෙන යාමට නොහැකි තත්ත්වයක් මතු වේ. ඇතැම්විට පුද්ගලයා මානසික රෝගියෙකු වීමට ද හැකියාවක් ඇත. ජාතක කතා පොතෙහි එන රෝහිණී ජාතකයෙහි එන දාසිය විසින් මැස්සන් එළවාදමන්න යැයි සිය මව විසින් පැවසූ පසු මැස්සන් එළවා දමන්නේ යැයි සිය මවට පහරදී ඇය එතැන ම මිය යාම සිදු වේ. එමෙන් ම මූගපක්ඛ ජාතකයේ එන තේමිය කුමරා සොළොස වසරක් අන්ධ, ගොළු හා බිහිරි අයෙක් ලෙස ජීවත්ව පෙන්වීම ද නිදසුනකි. ආචාරිය ජාතකයේ අපරිමාතු නම් තොටියා යහපත ගැන හෝ කර්මය ගැන කිසිවක් නොසිතා වස්තු සත්කාර නොලැබීම හේතුවෙන් මුලාවට පත්ව අවසානයේ රාජ දණ්ඩනයට පවා මුහුණදීමට සිදු වේ.

v. යක්ෂ උන්මාදය (Dissociative Identity Disorders / Multiple Personality Disorder)

මෙය බොහෝවිට මානසිකව ගොඩනඟාගත් සිදුවීමක් කේන්ද්‍ර කොට එයට අධිභෞතිකවාදී වස්තු ආරෝපණය කොට එහි බලපෑම මත පුද්ගල චර්යාවේ යම් යම් වෙනස්කම් දක්නට ලැබෙන තත්ත්වයකි. මාතාංග ජාතකය ද මේ සඳහා නිදසුනකි. බටහිර සමාජය තුළ ද අසාමාන්‍ය මනෝවිද්‍යාවේ ඉතිහාසය තුළ ප්‍රාග් ඓතිහාසික යුගයේ දී හා මධ්‍යකාලීන යුගය තුළ මෙවැනි කාරණා හේතුවෙන් මානසික රෝග ඇතිවන බවට පිළිගැනෙන්නට විය.

vi. පිත්ත උන්මාදය (Melancholic / Depression / Mood Disorders)

මෙහි දී ශරීරයේ පිත අධිකවීමෙන් ඇතිවන තත්ත්වයකි. බටහිර සම්ප්‍රදාය තුළ මෙවැනි රෝග ඇතිවීම සඳහා හේතුවන්නේ ශරීර අභ්‍යන්තරික රසායනිකයන් වෙනස්වීමයි. මෙහිදී ප්‍රධාන වශයෙන් පුද්ගලයාගේ මනෝභාවයන් වෙනස්වීම හා චර්යාව වෙනස්වීම දක්නට ලැබේ. ජාතක කතා පොතෙහි සඳහන්වන උම්මදන්ති ජාතකයේ රජුට උම්මදන්තියගේ ප්‍රේමය දිනාගත නොහැකි වූ විට ඔහු තුළ රාජකීය කටයුතු පිළිබඳව ඇති කැමත්ත අඩුවීම, නිකරුනේ කාලය ගත කිරීම, ඇඳට වී කල් ගත කිරීම, නිදිවැරීම, හැඬීම හා මරණය ගැන කතා කරමින් සිටීම තුළින් ගම්‍ය වනුයේ රජු උග්‍ර විශාදයට පත්ව

සිටිනු බවයි. අසාතමන්ත ජාතකයේ එන භික්ෂුව කාන්තවකට සිත් බැඳී ඇය අකැමතිවීමෙන් සියලු කමටහන් නවතා ඉච්ඡාභංගත්වයට පත්ව උකටලීව සිටීම තුළින් දිස්වන්නේ ද විශාද තත්ත්වයෙන් පෙළෙන බවයි. කුස ජාතකයේ එන කුස රජු ද පබාවතීගේ කැමත්ත තමාට නොලැබීම හේතුවෙන් සියල්ල අත්හැර කල්ගත කරන්නට විය.

vii. සුරා උන්මාදය (Substance Related Disorders)

ජාතක කතා පොතෙහි එන සුරාපාන ජාතකයේ එන සාගත නම් භික්ෂුව සුරාව පානය කොට විකාර රූපී ලෙස හැසිරෙන ආකාරය මෙයට කදිම නිදසුනකි. මීට අමතරව කුම්භ ජාතකය, ධර්මද්වජ ජාතකය තුළ ද මේ පිළිබඳව සඳහන් වේ. මෙවැනි අවස්ථාවකදී පුද්ගලයා සිහිමුලාවට පත්වූවෙකු මෙන් ක්‍රියා කරන අතර ඇතැම්විටෙක ඉන් තමාට මෙන් ම අනෙකාට ද හානි පමුණුවනු ඇත. නූතන සමාජය තුළ ද මත්ද්‍රව්‍ය හා මත්පැන්වලට ඇබ්බැහිවීම යන්න ඉතා ප්‍රබල ගැටලුවක් බවට පත්ව ඇත.

viii. ව්‍යසනඋන්මාදය (Trauma and Stress related Disorders / Somatoform Disorders)

බටහිර සම්ප්‍රදාය තුළ කාංසා වර්ගයට අයත් රෝගී තත්වයන් මෙයට අයත්වන අතර බොහෝවිට මිනිසා විසින් මිනිසා වෙතත් පරිසරය වෙතත් සිදු කරන ව්‍යසනකාරී අත්දැකීම් හේතුවෙන් ද කාංසාවට හා ආතතියට පත් වේ. ජාතක කතා පොතෙහි එන මණිකුණ්ඩ ජාතකයට අනුව බෝසතුන් අසාධාරණ ලෙස සිරගත කිරීම හේතුවෙන් රජුගේ ශරීරයේ හේතු විරහිත වේදනාවක් ඇතිවීම දෛහික මනෝ රෝගය වැළඳුණු අවස්ථාවක් ලෙස පෙන්වාදිය හැක (කරුණාතිලක, 2005). මීට අමතරව මඛාදේව ජාතකය, වානර ජාතකය, මණිකුණ්ඩල ජාතකය වැනි කතා පුවත් ද දැක්විය හැක (අමරකෝන්, 2011).

සමාලෝචනය

"පන්සියපනස් ජාතක කතා පොත" පිරික්සීමේදී ඒ තුළින් ප්‍රකට කෙරෙන ඇතැම් ආඛ්‍යානයන් මගින් නූතන මනෝවිද්‍යාවෙහි

එන ප්‍රධාන මානසික රෝගාබාධ 20 කට අධික ප්‍රමාණයක් සහ උප රෝගාබාධ ගණනාවකින් සමන්විත "මානසික රෝග පිළිබඳ රෝග විනිශ්චය සහ සංඛ්‍යානමය දත්ත අත්පොතෙහි" අන්තර්ගත ඇතැම් අසාමාන්‍ය චර්යාවන්, මානසික අක්‍රමතා සහ රෝග සමඟ සංසන්දනාත්මකව බැලීමේදී යම් යම් සමානකම් ඇති බව ද එහෙත් සමස්තයක් ලෙස සලකා බැලීමේදී මුළුමනින්ම සමානුපාත නොවන බව හඳුනා ගත හැකි විය. "මානසික රෝග පිළිබඳ රෝග විනිශ්චය සහ සංඛ්‍යානමය දත්ත අත්පොත" නිර්මාණය වනුයේ මානසික සෞඛ්‍ය වෘත්තිකයින් හට සායනික මට්ටමින් රෝග නිර්ණය කිරීමේ පසහුව උදෙසා බැවින් ඉන් මනෝව්‍යාධීන් සම්බන්ධ බොහෝ ගැඹුරින් විද්‍යාත්මක පදනමකින් යුතුව කරුණු ඉදිරිපත් කර තිබේ. "ජාතක පොත" බුදුරජාණන් වහන්සේගේ සත්ත්ව හා මනුෂ්‍ය ආත්මභවයන් සමඟ සම්බන්ධ උත්පත්ති කතා පදනම් කොටගත් කතා ප්‍රවෘතීන්ගෙන් සමන්විත වූවක් වන අතර එම ආඛ්‍යානයන්හී එන විවිධ පුද්ගල චරිතයන්හි දක්නට ලැබෙන අසාමාන්‍ය චර්යයා ස්වභාවයන්, පෞරුෂමය හා මානසික ලක්ෂණ පදනම් කොට ගෙන ඉහත සඳහන් ආකාරයෙහි අසාමාන්‍ය චර්යාවන් කිහිපයක් පමණක් හඳුනා ගන්නා ලදි.

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

අමරකෝන්, සුරංග. (2011), *මානසික සුවය බෞද්ධ හා බටහිර මනෝවිද්‍යාත්මක ආකල්ප තුලනාත්මක විග්‍රහයක්*, කර්තෘ ප්‍රකාශනයකි.

කංකනම්ගේ, සුගත්. (2016), *සරල මානසික පීඩා, කිරුළ ප්‍රකාශන*, මිනුවන්ගොඩ.

කරුණාතිලක, ඇස්. ඩබ්ලිව්, (2005), *පන්සිය පනස් ජාතක පොත් වහන්සේ 1*, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.

කරුණාතිලක, ඇස්. ඩබ්ලිව්, (2005), *පන්සිය පනස් ජාතක පොත් වහන්සේ 2*, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.

කුමාරසිංහ, ආර්යදාස. (1987), *මාධව නිදානය*, ආයුර්වේද දෙපාර්තමේන්තුව.

ගල්මංගොඩ, සුමනපාල. (2014), *බෞද්ධායුර්වේද මනෝකායික චිකිත්සා ක්‍රමය හැඳින්වීමක්*, නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනය, කැලණිය.

චන්දකිත්ති හිමි, යාලේගම. (2007), *ජාතකට්ඨ කතා පළමු වැනි කොටස*, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.

චන්දවිමල හිමි, රේරුකානේ. (2016), *කෙලෙස් එක්දහස් පන්සියය*, ශ්‍රී චන්දවිමල

ධර්ම පුස්තක සංරක්ෂණ මණ්ඩලය, පොකුණුවිට.

ධම්මකිත්ති හිමි, විලේගොඩ. (1967), *භේසජ්ජමඤ්ජුසා*, ඇල්පිටිය.

ධර්මවංශ, ශ්‍රී මාතර, (2015), *විස්තරාර්ථ සන්න සහිත විශුද්ධි මාර්ගය*, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.

පන්සිය පනස් ජාතක පොත් වහන්සේ, (2005), බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.

ප්‍රනාන්දු, වාසනා (2018) උපරතන හිමි, කොටියාගල සහ සෝරත හිමි, වැලිවිට (සංස්.), *බෞද්ධ මනෝවිද්‍යාව හා මනෝප්‍රතිකාර*, පෞරුෂය සහ පෞරුෂ සංවර්ධනය : බෞද්ධ මනෝවිද්‍යාත්මක විමසුමක්, කාංචන ප්‍රින්ටර්ස්, නුගෙ ෆගොඩ.

බුද්ධදාස, ආර්. (1960), *චරකසංහිතාව*, රත්න ප්‍රකාශකයෝ, මරදාන.

මජ්ඣිම නිකාය 1, සොයිසා පරිවර්තන, සීමාසහිත ඇස්. ගොඩගේ සමාගම, මරදාන.

රණතුංග, එම්. එස්, (2015 මැයි), මනසට සුව දෙන ජාතක පොත, *දිවයින බදාදා අතිරේකය*, සීමාසහිත උපාලි පුවත්පත් සමාගම, කොළඹ 13.

රණවක, ඩී. එස්. සහ හපුආරච්චි, ගාමිණී, (1996), *අසාමාන්‍ය මනෝවිද්‍යාව*, මනෝවිද්‍යා අධ්‍යයන ආයතනය, කොළඹ 4.

වික්‍රමසිංහ,මාර්ටින්. (2015), *ජාතක කතා විමසුම*, සීමාසහිත සරස පෞද්ගලික සමාගම, රාජගිරිය.

සිල්වා, රංජිත්,(2015), *මානසික රෝග හඳුනා ගනිමු*, කර්තෘ ප්‍රකාශනයකි.

සුසීම හිමි සහ වෙනත් අය (සංස්.), (2004), *ජාතක කථා විමසුමට පිවිසුම*, සංහිඳ මුද්‍රණ, නුගේගොඩ.

හරිශ්චන්ද්‍ර, ටොළුෂා, (2013), මනෝවෛද්‍ය ඩී. වී. ජේ. හරිශ්චන්ද්‍රයන් ගේ *බුද්ධ ධර්මය සහ මනෝවෛද්‍ය විද්‍යාව*, විජිත යාපා ප්‍රකාශන, කොළඹ 4.

Diagnostic and statistical manual of mental disorders (5th Edi.), American Psychiatric Association, England.

Fernando, Wasana. (2017, August 13) Historical Views of Abnormal Behaviour, Retrieved on 15 January, 2019 from https://www.nerdynaut.com/

Harishchandra, Tolusha. (2015), *Psychiatric Aspects of Jataka Stories: A Modern Analysis of the Ancient Stories of the Buddha's Past Life*, Vijitha Yapa Publications, Colombo 04.

Jayathunga, M. Ruwan, (2014, September 28th) *The Buddhist Jataka Stories and the DSM-based Mental Disorders*, Retrieved on 15 January 2019 from https://www.lankaweb.com/news/item/2014/09/28/the-buddhist-jataka-stories-and-the-dsm-based-mental-disorders/

World Health Organization, (21 Sep 2021), Comprehensive Mental Health Action Plan 2013-2030, Retrieved on 15 January 2019 from https://www.who.int/publications/i/item/9789240031029